
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ ඇසළ අව අටවක පෝදා 2022 ජූලි 20 බදාදා BUDUSARANA WEDNESDAY JULY 20, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 06 පත්‍රය , පිටු 10 ආරම්භය 1965 - 06 - 13





මතකභත්ත ජාතක කතාව ඇසුරිනි

# ප්‍රශ්නයකට විසඳුම් සෙවීමට පෙර තමන් කවුදැයි හඳුනා ගන්න



**යහපත් වූ ගුණධර්ම ඇසුරෙන් සකස් කරගත් පුද්ගල සබඳතා සමාජය බැබළීමට හේතු වේ. ස්වකීය ශ්‍රාවකයන් මුණගැසුණු අවස්ථාවල දී බුදුරජාණන් වහන්සේ පිළිසඳර කතාව ආරම්භ කෙළේ ඇවැත්නි, කෙසේ ද? ඔබ වහන්සේ සමගියෙන්, සතුටින්, විවාදයකින් තොරව කිරිත් දියත් මුසු වූවා සේ ඔවුනොවුන් දෙස ප්‍රියමනාප බැල්මෙන් බලමින් වසන්නාහුදැ"යි, අසමිනි.**



ඌරුගමුවේ අස්සජී හිමි

ඒ තුළින් ම උන්වහන්සේ කලබලකාරීත්වයෙන් තොර ප්‍රියමනාප වාසය අගය කර ඇති බව අපට පැහැදිලි වෙයි.

"කලහකාරී" "ප්‍රචණ්ඩකාරී" යන වචන නිතර භාවිත වනු අසන්නට ලැබෙයි. එම වචන අප සිත් තුළ ජනිත කරවනුයේ අප්‍රසාදයකි. ප්‍රචණ්ඩකාරී යන වදන ඇසූ සැණින් ම අප දුටු ගැටුමක් හෝ ඒ ආශ්‍රිත විනාශයක් පිළිබඳ මතකයට නැඟෙයි.

ඒ ඒ පුද්ගලයන් සතු ප්‍රශ්නවලට මුහුණදීමේ ශක්තිය මත ප්‍රචණ්ඩකාරී අවස්ථාවන් ඇතිවීම බොහෝ ස්ථානවල දැකිය හැකි දෙයකි. ප්‍රචණ්ඩත්වය ඇතිවනුයේ සිතට නැඟෙන ද්වේශ සහගත වූ අදහස් නිසා ය. යම් විටෙක එවැනි අදහසක් සිතට නැඟුණු විට අප ක්‍රියා කළ යුත්තේ කෙසේ දැයි, බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

ඒ අනුව අපට යම් විටෙක ද්වේෂ සහගත චේතනාවක් පහළ වූයේ යැයි සිතමු. එම ද්වේෂය අපට දුක් පිණිස පවත්නා බව පළමුව හොඳින් වටහා ගත යුතු ය. දෙවනුව, එය බාහිර සමාජයට ද අවැඩක් අහිතක් පිණිස ම හේතු වන බව තේරුම් ගැනීම අපහසු නොවනු ඇත. අපටත්, පොදුවේ සමාජයටත් අවැඩක් වන දෙයක් කොට අවසානයේ සිදුවන්නේ කුමක්ද? මානසික වශයෙන් පසුබෑමකටත්, පීඩනයකටත් පත්වීම යි. එය දිගින් දිගට ම මනසට වද දෙන සිදුවීමක් වනු ඇත.

එබැවින් අපටත්, සමාජයටත් දුක් පිණිස, අවැඩ පිණිස, මානසික පීඩනය පිණිස හේතු වන එම ද්වේෂ සහගත චේතනා විනාශ කර දැමිය යුතු ය. එසේ හටගන්නා වූ ත්, අනාගතයේ හටගැන්මට ඉඩ ඇත්තා වූත් ද්වේෂය මුළුමනින් ම බැහැර කිරීම අප මෙහි දී ගත යුතු බුද්ධිමත් ම ක්‍රියා මාර්ගය යි. ඕනෑම ප්‍රශ්නයකට මනා ඉවසීමකින් අවධානය යොමු කරවීමේ පුරුද්ද එයින් අපට ලැබේ. ස්වභාවයෙන් ම අපට ප්‍රශ්නවලට මුහුණදීමේ හැකියාවක් තිබේ. එහෙත් එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ය.

අද බොහෝ දෙනකු තුළ හැඟීම්වලට වහල්වීමේ ස්වභාවයක් පෙන්නුම් කෙරේ. එය ප්‍රචණ්ඩත්වය කරා පුද්ගලයා යොමු කරවන මාවතක් වැනි ය. ඉවසීමේ ශක්තිය ඇති කෙනකුට ගැටලුවක් ඇති වූ අවස්ථාවක දී එම ගැටලුවෙන් මිදී අලුත් තත්ත්වයකට හැඩ ගැසීමට හැකියාව තිබේ. ගැටලුව සඳහා හේතුසාධක වූ දේ අවබෝධ වීමෙන් මානසික පීඩාකාරී තත්වයෙන් තුරන් වීමට හැකියාව ලැබේ.

**අද බොහෝ දෙනකු තුළ හැඟීම්වලට වහල්වීමේ ස්වභාවයක් පෙන්නුම් කෙරේ. එය ප්‍රචණ්ඩත්වය කරා පුද්ගලයා යොමු කරවන මාවතක් වැනි ය.**

එහෙත් සමහරුන් ගේ මෙම ඉවසීමේ ශක්තිය ඉතා දුර්වල ය. එවැන්නෝ හැමවිට ම ප්‍රශ්නවලට ලෙහෙසි හා ක්ෂණික විසඳුම් සොයති. විටෙක ප්‍රශ්නවල දී ලබා ගත හැකි ක්ෂණික විසඳුමක් ලෙසට ප්‍රචණ්ඩකාරීව හැසිරෙති.

මෙම ප්‍රචණ්ඩකාරිත්වය නම් වූ නොමනා පිළිවෙත පාසල් සිසුන් අතරට පවා දැන් දැන් පැමිණ තිබේ. සන්නිවේදන මාධ්‍ය තුළින් වරින්වර අපි ඒ පිළිබඳ දැක ඇත්තෙමු. ප්‍රචණ්ඩ ක්‍රියා නිසා පොදු දේපළ විනාශ කළ, අංග විකල තත්ත්වයට පත් වූ සහ ජීවිත අහිමි කර ගත් අය පිළිබඳ වූ වාර්තා ද ඒ අතර වෙයි. මෙහි දී අප හොඳින් වටහා ගත යුත්තක් තිබේ. එනම් මිනිසා, තිරිසන් සතුන්ගෙන් වෙන් වී ඇත්තේ බුද්ධිය හා ක්‍රියාකාරිත්වය මත බවයි. එකී අංග දෙක ම අන්තයට ම පිරිහී ගිය හොත් මිනිස්-තිරිසන් භේදයක් ඇති නො වේ. ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කරන තිරිසන් සතුන් අපි කොතෙකුත් දැක ඇත්තෙමු. ඔවුන්ට ඉවසීම හෝ ප්‍රශ්න දෙස බුද්ධිමත් ව බැලීම හුරු කළ නොහැකි ය. එබැවින් දිගින් දිගට ම ඔවුහු ප්‍රචණ්ඩත්වය පෙන්නුම් කරති. මිනිසා ද එම තත්ත්වයට පත් වුවහොත් සිදුවන්නේ කුමක්ද?

අප ගේ සෑම හැසිරීමක දී ම තම තත්ත්වය පිළිබඳව ද මනා විමසිලිමත් භාවයකින් සිටිය යුතු ය. නූගතුන් සේ අනවශ්‍ය වාද භේද ආදියට සම්බන්ධ වී ප්‍රචණ්ඩ ලෙස සමාජයේ හැසිරුණ හොත් පළමු ව අප සමාජයේ කොන් වූ තත්වයකට පත්වනු ඇත. ඒ නිසා මව්පියන්ට ද සහෝදර සහෝදරියන්ට මෙන් ම ඥාති හිතමිත්‍රාදීන්ට ද අප නිසා පසුතැවීමට සිදුවනවා නොවේ ද?

ඇතැම්විට මවුපියන්ට, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට විරුද්ධව ප්‍රචණ්ඩකාරී ව ක්‍රියා කරන අය ද අද සමාජය තුළ දැකගත හැකි ය. එයට හේතුව තමා වෙනුවෙන් ඔවුන් කළ කැපකිරීම හඳුනාගෙන නොතිබීමයි. මෙය මුල අමතකවීම" ලෙස ද භාවිතයේ පවතියි.

එහෙත් අප එවන් ගුණමකු තත්ත්වයකට පත් නොවිය යුතු ය.

නූතන සමාජය තුළ ඉගෙනීමෙන් තොර ව, ප්‍රචණ්ඩකාරිත්වය කරා බාල පරපුර ඇද දමන බලවේග බහුලව පවත්නා බව වටහා ගත යුතු ය. විවිධාකාර පුද්ගලයන් ආශ්‍රයේ දී කල්පනාකාරී වීම මෙහි දී ඉතා වැදගත් ය. බාල අවධියේ සිට ම සියලු ම දෙනා කණ්ඩායම් වශයෙන් හැසිරීමට දැඩි කැමැත්තක් දක්වති. කණ්ඩායම් ලැදියාව වැරැදි ලෙස යොදා නොගෙන, වගකීම් මනාව තේරුම් ගෙන, ක්‍රියා කිරීමට ඔවුන් යොමු කරවීම අප සතු කාර්යයකි. මක් නිසාද යත් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන සිසුහු තමන් ළඟා විය යුතු යහපත් අරමුණු කරා ළඟා වන්නෝ නොවෙති. තමත් ජීවත් වන සමාජ වටපිටාවට ද ඔවුන්ගෙන් සිදුවනුයේ බලවත් අසාධාරණයකි.

**"ලෝක ධර්මය පිළිබඳ කම්පා නොවීම උතුම් මංගල කරුණක් ලෙස ධර්මයේ දක්වා ඇත. මෙහි දී අප ගේ සිත මුල්තැන ගනී. වහ වහා නොයෙක් අරමුණු කරා දිවෙන සිත සන්සුන් කර ගත යුතු ය. ඒ සඳහා සීලයත්, භාවනාවත් හොඳ ම ප්‍රතිපත්තිය වේ."**

පළමු ව ඔවුන් තමා කෙරෙහි තබා ඇති අනාගත අපේක්ෂාවන් බිඳ දමනු ඇත. අනාගත අපේක්ෂාවන් බිඳ වැටුණු, අපේක්ෂා භංගත්වයට පත්වුණු සමාජ කණ්ඩායමකට ඔවුහු ඇතුළත් වෙති.

අප එකිනෙකා කෙරෙහි සහජීවනයෙන් බැඳී සිටින තාක් කල් ගැටුම් ඇති නො වේ.

මනා හැකියාවකින් යුක්ත ව ප්‍රශ්න දෙස බැලීමට බුදු දහම අපට උගන්වා තිබේ. ඒ සඳහා සමාජය හා ලෝකය පිළිබඳ ව ලබා ගන්නා දැනුම අත්‍යවශ්‍ය ය.

ලෝක ධර්මය පිළිබඳ කම්පා නොවීම උතුම් මංගල කරුණක් ලෙස ධර්මයේ දක්වා ඇත. මෙහි දී අප ගේ සිත මුල්තැන ගනී. වහ වහා නොයෙක් අරමුණු කරා දිවෙන සිත සන්සුන් කර ගත යුතු ය. ඒ සඳහා සීලයත්, භාවනාවත් හොඳ ම ප්‍රතිපත්තිය වේ.

සිත සන්සුන් කර ගැනීමෙන් ප්‍රශ්න දෙස නිදහස් ව බැලීමටත්, සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් පෙළඹෙයි. ඒ නිසා ප්‍රචණ්ඩකාරී අදහස්වලට යොමු නොවන අතර, උපේක්ෂා සහගත ව ප්‍රශ්නවලට මුහුණදීමේ හැකියාව ලැබේ.

# පසිඳුරන් දමනය පින් වැඩෙන උල්පතක්

**කරණීය මෙත්ත සූත්‍රයේ 'සන්තින්ද්‍රියෝ' නමින් අර්ථ ගන්වන්නේ ශාන්ත වූ ඉඳුරන් ඇති බව ය. දැමුණු ඉඳුරන් ඇති බව ය. එසේත් නැතිනම් ඉඳුරන් සංවරව ආරක්ෂා කරගෙන ඇතැයි යන අර්ථ දෙන්නේ ය.**

අපගේ ඇසට, කනට, නාසයට, දිවට හා ශරීරයට විවිධ අරමුණු හමුවේ. ඉඳුරන් නොසන්සුන් වන්නේ එම විවිධ අරමුණු හමුවේ ලෝභයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් ඒ හා ඇළෙන්නේ නම් ය. ගැටෙන්නේ නම් ය. ඒ අරමුණු අවබෝධයෙන් හඳුනාගෙන ඒවායෙහි නො ඇලෙනවා නම්, නොගැටෙනවා නම් අපගේ ඇස සන්සුන් වේ. කන සන්සුන් වේ. සියලු ඉඳුරන් සංවර වේ.

ඒ ශාන්ත බව, සංවර බව, භික්ෂූන් වහන්සේට පමණක් නියම වූවක් නොවේ. ගිහි ජීවිතයේ ශික්ෂණයට ද හික්මීමට ද හේතු වේ.

මේ සංසාරයේ කෙළවරක් දැකිය නොහැකි වන්නේ වැරැදි ලෙස, දුෂ්‍යවන ලෙස, කිළිටිවන ලෙස ඉන්ද්‍රිය ක්‍රියාත්මක කිරීම නිසා ය. එවැනි පුද්ගලයා රෝදයක් කැරකැවෙනවා සේ කැරකි කැරකී සසරේ ගමන් කරන කෙනකු බවට පත්වේ. සතර අපායේ ද, මිනිස් ලොවෙහි ද, දිව්‍ය ලෝකයේ ද ආදි ලෙස ඉපදෙමින්, මිය යමින් සසර සැරිසරනු ඇත.

සතර අපාය අපමණ දුක් වේදනා ගෙන දේ. මිනිසුන් ලෙස ඉපදුණ ද දුකෙහි අඩුවක් නොවේ. මේ බිය උපදවන සංසාරය නම් වූ දුක් ගොඩෙන් නිදහස් වන්නට නම් ඇස රැක ගත යුතු ය. කන, නාසය, දිව, ශරීරය මනස රැකගත යුතු ය. ඉන්ද්‍රියයන්හි වහලකු බවට පත්වන්නේ අවබෝධයෙන්, සතියෙන් හා ප්‍රඥාවෙන් ඉන්ද්‍රිය මෙහෙය වන්නේ නැති නිසා ය.

මෙහිදී ඇලීම් හා ගැටීම් ඇතිවන ආකාරය නිවැරැදිව වටහා ගැනීම වැදගත් වේ. ඇසට ප්‍රිය රූප දකින විට අපි ඒ දෙස ආශාවෙන් බලා සිටිමු. ආස්වාදයක් ලබමු. නැවත දකින්නට පෙළඹෙමු. එයින් ද නොනැවතෙමු. එය ළං කර ගන්නට උත්සාහ කරන්නෙමු. මේ ස්වභාවය අරමුණෙහි ඇලීමයි. උත්සාහය අසාර්ථක වූයේ නම් ප්‍රතිඵලය දුක්ඛදායක ය.

මොහොතක් සිතන්න. අසල්වැසියා ලොකු ගෙයක් හදනවා නම් සමහර කෙනකුට එය ඉවසන්නට නොහැකි ය. ඊර්ෂ්‍යාවෙන් දැවෙන්නේ ය. අන් අය සමඟ ද ඒ සිතිවිලි බෙදා හදා ගන්නට යන්නේ ය.

"කුමට ද මෙ පමණ ලොකු ගෙයක්. කොහොම සල්ලි හම්බකරල ද දන්නේ නෑ" යි විවිධ දේ කියන්නේ ය. නොදැනුවත්ව ම මේ සිදු කරගන්නේ කුමක්ද?

ඒ නිවස දකින මොහොතක් පාසා පව් රැස්කර ගැනීම ය. අනවශ්‍ය බරකින් සිත පෙළීම ය. රෝගාබාධයන්ට ගොදුරුවීම ය. මානසික පීඩනය ඇතිකර ගැනීම ය. අකුසල් රැස්කර ගැනීම ය. අනවශ්‍ය ප්‍රශ්නයක් නිසා මෙලොව දුක් ගොඩක් කර ගැනීම ය. මෙලොව එලෙස දුක් විඳ පරලොව ද දුකට පත්වීම ය.

අනුන්ගේ දේ තමන්ට ප්‍රශ්නයක් කර ගන්නේ කුමට ද? එය අනවශ්‍ය බරක් කරගසා ගැනීමකි. ඒ දෙස අවංක හදවතින්, සතුටින් බලන්නට පුරුදු වන්න. එය ඔබ උදාකර ගත් පුණ්‍යවන්ත බවකි. සතුටින් බලන මොහොතක් පාසා ම ඔබගේ සිත පින් උල්පතක් බවට පත්වන්නේ ය. මෙ ලෙසම රාගයෙන්, තණ්හාවෙන්, වෛරයෙන් තොරව ලෝකය දෙස බලන්න පුරුදු වන්න.

කපුටා උදෑසනම අවදිවන පක්ෂියෙකි. එහාට මෙහාට පනිමින් මේ පක්ෂියා කරන්නේ ම කසළ ගොඩවල් ඇවිස්සීම ය. ඒ සතා එලෙස වෙහෙසෙන්නේ කුස පුරවා ගන්නට ය. සමහර මිනිස්සු ද අනුන්ගේ කුණු අවුස්සති. ඒ කුස නොව සිත පුරවා ගන්නට ය. අනුන්ගේ ඇද කුද, අඩු පාඩු වගතුග ගැන සෙවීමට ය. ඒ කන අසංවරව හැසිරවීමකි. කන මෙහෙයවා පව් පුරවා ගැනීමකි.

පිරිත් දෙසුමකට, දහම් දෙසුමකට කන් දෙන්න. යහපත් කතා අසන්න. කන පින් රැස් කර ගන්නා උල්පතක් කර ගන්න.

නාසය ගඳ සුවඳෙහි ඇලීම් ඇති කරයි. ගැටීම් ද ඇති කරයි. රස පසුපසම යනවා නම්, රසයෙහි ම ඇලෙනවා නම් දිව අසංවර ය. තමන්ට යහපතක් නොවන, අනුන්ට ද අයහපත් කිසිම වචනයක් මුවින් පිට නොකරන්න. බොරුව, වංචාව, රැවටීම, කේළම් සේ ම අන් සිත රිදවන වචන නොකියන්න.

මව්පිය දූ දරු අසමගිකමට ආදී බොහෝ දේට කට මුල් වේ. ඒ නිසා දිව නම් වූ ඉන්ද්‍රිය අවබෝධයෙන් හසුරුවන්න. කරුණාව, දයාව, මෛත්‍රිය පෙරදැරි කර ගන්න. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, ලෝභය ආදී ක්ලේෂයන් විසින් රිදවනු ලබන්නේ, දවනු ලබන්නේ අනුන් නොව තමන් ම ය. ඒ නිසා ඒ කෙලෙස් ධර්මවලට වහල් නොවන්න. වසඟ නොවන්න.

ජීවිතය ලස්සන වන්නේ තැනට සුදුසු ලෙස කටයුතු කිරීමේ නුවණ වන්නේ නම් ය. කරණීය මෙත්ත සූත්‍රයේ 'නිපකෝ' ගුණය ලෙස දැක්වෙන්නේ තැනට සුදුසු නුවණ ඇති බව ය. එනම් ස්ථානෝචිත ප්‍රඥාව ය. භාවනානුයෝගී භික්ෂූන් වහන්සේ වෙනුවෙන් දේශනා කොට ඇත්තේ පොදුවේ ගිහි පැවිදි සැමට ඉතා වැදගත් ඉගැන්වීමකි. දෛනික ජීවිතයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල සාර්ථකත්වයට මහඟු උපදේශනයකි.

අවස්ථාවට ගැළපෙන නිවැරැදි චින්තනය, ඊට අදාළ ක්‍රියාකාරිත්වය, ස්ථානෝචිත කතාව ජීවිතය ලස්සන කරයි. චරිතයට ගැළපෙන පරිසරය, භාවනාවට සුදුසු පරිසරය, බාධක හඳුනාගැනීම, ඒ පිළිබඳ අදාළ උපදෙස් ලබා ගැනීම, අල්ප කෘත්‍ය බව, ඉන්ද්‍රිය සංවරය ආදී කරුණු සලකා බැලීම භාවනානුයෝගී භික්ෂූන් වහන්සේ නමකට වැදගත් ය.

නිවන් ලබා ගැනීම සඳහා අදාළ කරුණු විමසීම, එනම් උචිත සාධක ළංකර ගැනීම හා අනුචිත කරුණු බැහැර කිරීම නිපක ගුණ ඇත්තාගේ වගකීමකි.

ඉගෙනුම ලබන දරුවන්ට ද මේ මා හැඟි ගුණයකි. ඉගෙනුම සඵල කර ගන්නට ස්ථානෝචිත ප්‍රඥාව අත්‍යවශ්‍ය ය. ඉගෙනීමට බාධා වන දෙයින් දුරස්වීම එහිදී ඉතා වැදගත් වේ. කලණ මිතුරන් හඳුනා ගැනීම, වීර්යවන්ත බව, අවශ්‍ය උපදේශන ලබා ගැනීම ඉගෙනුම් කාරක උපකරණ සම්පාදනය, ස්ථානය, පරිසරය සැලකීම අත්‍යවශ්‍ය ය.

බොහෝ දෙනකුට එදිනෙදා ජීවිතයේ සැලසුමක් නැත. උදෑසනින් පිබිදී මොහොතක් සිතන්න. අප අදහස් කරන දේ ක්‍රියාත්මක කිරීමේ දී බලාපොරොත්තුවන ප්‍රතිඵලය කුමක්ද? ඒ සඳහා අවශ්‍ය කරන දේ මොනවාද? බාධක වැට කඩොලු මොනවාද? විසඳා ගැනීමට අනුගමනය කළ යුතු නිවැරැදි ම ක්‍රමවේදය කුමක්ද? සිතන්න. මේ ආකාරයෙන් අවධානය යොමු නොකොට කරන ලද කාර්යයන් සාර්ථක වූයේ ද? අසාර්ථක වූයේ ද? පිළිතුර ප්‍රත්‍යක්ෂ ය. ඒ, කරන ලද කාර්යයන්ගෙන් සියයට අනූවකටත් වඩා අසාර්ථක වීම ය.


ළිං මැඩියාට ලෝකය නොපෙනේ. දකින්නේ ළිං පතුළ පමණි. ළිං මැඩියකු සේ ගෙවන ජීවිතයේ ඵලය කුමක්ද? අනතුර, අවදානම අසාර්ථක බව පමණි. ලොව විවිධ සිදුවීම්, වැදගත් චරිත විමසන්නට පුරුදු වන්න. පොත පත කියවන්න. ඒ චරිත අභියෝග ජයගත් ආකාරය තේරුම් ගන්න. ඒ අවබෝධය අවස්ථාව ලද සැනින් ප්‍රඥාවන්ත ලෙස භාවිතයේ යොදවන්න.

යම් උදව්වක්, උපකාරයක් අවැසි මොහොතක පුද්ගලයාගේ මානසික පසුබිම හඳුනා ගන්න. ඔහු ගැන කතා කළ යුතු සංවේදී ක්‍රමය ගැන සිතන්න. උපකාරය ඉදිරිපත් කරන ආකාරය සිතන්න. සමහරු දරාගත නොහැකි වේදනාවක දී, ආවේගයක දී සිය ජීවිතය ගැන නොසිතයි. එහි වටිනාකම නොදකියි. සියතින් ම දිවි සිඳ ගනියි.

ඇතැම් විට අනුන් ද නසයි. ජීවිතයේ දැනුම් තේරුම් ඇති කවර අවධියක දී වුව දීඝිති කෝසල ජාතකය ආදර්ශයට ගත හැකි ය. පුතකුට අම්මා, තාත්තා තරම් වටිනා සම්පතක් තිබෙනවාද? ඒ උතුම් මව්පිය දෙපළ ඝාතනය කළ කෲර රජු සිය උකුලේ නිදා සිටිනා මොහොතේ දී දීඝායු කුමරුට ඔහු මරා දමන්නට ආවේගයක් එයි. එක් අතකින් රජුගේ කෙස්වැටිය අල්ලා, අනික් අතින් කඩුව ගෙන කුමරු මෙසේ සිතයි.

'මගේ පියා මිය යන මොහොතේ මට අවවාද කළේ තමන් කරන දෙය හොඳින් සිතා බලා පරීක්ෂාකාරීව කළ යුතු බවයි. දුරදිග බලන ලෙසයි. ළඟ නොබලන ලෙසයි.

ඒ අනුව ඔහු රජුගේ කෙස්වැටිය අතහරියි. එසවූ කඩුව ද පසෙකින් තබයි. කුමරුගේ ස්ථානෝචිත බව ජයග්‍රාහී අනාගතයක ආරම්භයයි. ප්‍රශ්නයක දී, අභියෝගයක දී කලබලවීම, මන්දෝත්සාහී වීම, තිගැස්සීම, පසුබෑම සුදුසු නොවේ. අවශ්‍ය බුද්ධිමත්ව සිතීමයි. කරුණු විමසීමයි. තමන්ට අයහපතක් නොවන, අනුන්ට ද අයහපතක් නොවන වඩාත් සුදුසුම තීරණය ගැනීමයි.



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**



බුදුසරණ
35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## ඇසළ අව අටවක 2022-07-20

## සුවදායක ජීවිතයක වටිනාකම

කායික මානසික සුවදායී බවින් ජීවත් වන්නට ලැබේ නම් එය මහත් භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි. එහෙත් ඒ සැනසීම, සන්තෘෂ්ඨිය ලබන්නෝ අද අපේ සමාජයේ විරල ය. වැඩි පිරිසක් කයින් ද, මනසින් ද රෝගීහු වෙති. බොහෝ විට සිදු වන්නේ සිතිවිලි පාලනය කර ගත නොහැකිව මනසින් දැවී කය ද ලෙඩ කර ගැනීම ය.

කායික මානසික සුවපත් බවට 'සම්බුදු දහම' වටිනාකම මේ යැයි ප්‍රමාණ කළ නොහැකි ඔසුවකි. නියත පිළියමකි. බොහෝ දෙනෙක් ඒ ඔසුව හඳුනති. එහෙත් දැනුමට සීමා කරනු විනා ජීවිතයට පුරුදු පුහුණු නොකිරීම නිසා ඉන් ප්‍රයෝජනයක් ලබන්නේ නැත. රෝගියෙක් නිසියාකාරව ඖෂධ පරිහරණය නොකළේ නම්, එය සිරුරට පත්තියම් වන්නේ නැත. දහම නම් ඔසුව ද එසේ ය. ජීවිතයට පුරුදු පුහුණු නොකළේ නම් ඉන් සැබෑ සුවය නොලැබෙන්නේ ය. අපේ සමාජයේ වැඩි පිරිසක් අසහනදායී බවට ගොදුරු වී සිටින්නේ මේ හේතුව නිසා ය.

කරණීය මෙත්ත සූත්‍රයේ ‘සන්තුස්සකෝ’ යනුවෙන් අර්ථවත් කරන්නේ ලද දෙයින් සතුටු වීම ය. එනම් ලැබුණ පමණින් සෑහීමට පත්වීම ය. අප අසහනයට පැමිණෙන්නේ බොහෝ විට එම ගුණය නොමැති වීම නිසා ය. ලැබෙන්නට, ලැබෙන්නට තව තවත් රැස් කිරීම ම අරමුණු කර ගනිමින්, ඒ මඟම හැල්මේ දිව යන්නට ය, බොහෝ දෙනෙක් උත්සුක වනුයේ. එවැනි තත්ත්වයක කෙලෙස නම් මානසික සුවදායී බවක් ලබන්නද?

කෙනෙක් ලැබෙන දෙයින් නොසතුටු වන්නේ අන් අය සමඟ සංසන්දනයට යෑම නිසා ය. සමාජයේ බොහෝ බෙදීම් වේ. කෙනකුට යාන වාහන, මිල මුදල්, ගේ දොර ඉහළම මට්ටමින් හිමි ය. උත්සාහය, ධෛර්යය මත ඒ දේ හිමි කර ගත්තා වන්නට පුළුවන. එසේත් නැතිනම් පෙර කළ කර්ම ශක්තීන්ගෙන් ලැබුණා වෙන්නට ද පුළුවන. එය දකින තවත් කෙනෙක් උත්සාහ කරන්නේ ඊට වඩා ඉහළින් සම්පත් අත්පත් කර ගන්නට ය. තවත් කෙනෙක් පුහු ආටෝපයට කැමැති ය. තමන්ගේ ඇති හැකි කම් අනුනට පෙන්වීමට රුචිය. මේ කවර උත්සාහයක දී වුව ද අවසානයට අහිමි වන්නේ තමන්ගේ සැනසීම ය. ඒ, සිතිවිලිවල ඇති අවිචාරවත් බව නිසා ය.


ජීවිතය ගැන සැබෑ අවබෝධයක් ඇති කිසිවෙක් එසේ මිරිඟුවක් පසුපස හැල්මේ දිව යන්නේ නැත. සරල ජීවිතයේ ආස්වාදය විඳින ඔහු ධර්මානුකූල ව, අර්ථාන්විත ව ජීවිතය ගොඩනඟා ගන්නට වෙහෙස වේ.

අහසේ පියා සලන කුරුල්ලකුට ඇත්තේ පියාපත් බර පමණි. ඉතා සැහැල්ලු ය. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ භික්ෂූන් වහන්සේ ද කුරුල්ලකු මෙන් සැහැල්ලු විය යුතු බව ය. උන්වහන්සේ පහසුවෙන් පෝෂණය කළ හැකි විය යුතු බව ය. සුභර ගුණය යනුවෙන් හැඳින්වෙන්නේ එයයි. ගිහි ජීවිතයට ද මේ ගුණය ඉතාම වැදගත් වන්නේ සැනසිලි දායක ජීවිතයකට එය ඉතා ප්‍රයෝජනවත් වන බැවිනි.

පහසුවෙන් පෝෂණය කළ හැකි නම් ඕනෑම දුෂ්කර කාලයකට සැහැල්ලුවෙන් මුහුණ දීමට පුළුවන. අවශ්‍යතා සංකීර්ණ වන තරමට ඒවා නොලැබී යන විට දැනෙන වේදනාව වැඩි ය. දරා ගැනීමේ ශක්තිය අඩු ය.

ඇතැම් විට එවැනි තත්ත්වයක දී කුමන හෝ විදියකින් සම්පත් උපයා ගන්නට කෙනෙක් පෙළඹේ. එය ගැටලු රැසක ආරම්භයක් වීමට ද පුළුවන.

ලද දෙයින් සතුටු වන්නටත්, පහසුවෙන් පෝෂණය වීමටත් පුරුදු විය යුතු කුඩා කාලයේ දී ම ය. දරුවන්ට අනවශ්‍ය තරම් දේවල් ලබා දෙනවා වෙනුවට සරල ජීවිතයකට හුරු කරවීම මව්පිය වැඩිහිටියන්ගේ වගකීමකි. එවිට ඇති කල් හි ද, නැති කල්හි ද ජීවිතයට සතුටින් මුහුණ දීමට පුළුවන. සැනසීම ඇත්තේ තමන් සිතන පතන ආකාරය අනුව ය. සම්බුදු දහම ඒ සඳහා මඟ පෙන්වයි. අප කළ යුතු අවබෝධයෙන් ඒ මඟ අනුගමනය කිරීම ය.



# මල්දමක් ගොතන්නා සේ කුසල් රැස් කරන්න

**දඹදිව අඟුරට භද්දිය නුවර මැඬ නම් මහ සිටුවරයෙක් විය. ඔහු මහා ධනවතෙකි. ඒ ප්‍රමාණය කොපමණ දැයි කියා නිම කළ නොහැකි ය. සෑම සැපතින් පිරී යස ඉසුරු භුක්ති විඳිමින් ජීවත් විය. ඒ සිටුවරයාගේ පුත් රුවන ධනඤ්ජය නම් විය. ඔහු ද සිටුවරයෙකි.**

> “සැවැත් නුවර මිගාර සිටුතුමාගේ පුත් වූ පූර්ණවර්ධන සිටුතුමා සමඟ විශාඛා දේවියගේ සරණ මංගල්‍යය සිදුවිය. මහා පින් ඇති විශාඛා කුමරියට පරම්පරාවෙන් උරුම වූ නව කෙළක් පමණ වටිනා මහලිය පළඳනාවක් තම පියා වූ ධනඤ්ජය සිටුතුමාගෙන් ලැබුණි.”

සුමනා දේවිය ධනඤ්ජය සිටුතුමාගේ දේවියයි. සිටුතුමාගේත්, දේවියගේත් දියණිය වූයේ පින්වත් විශාඛාවෝ ය.

දිනක් බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වැඩම කළ සේක. එහිදී මැඬ මහ සිටාණෝ ද මිණිබිරිය වූ විශාඛාවන් ද ධර්මය අසා සෝවාන් වූහ.

සැවැත් නුවර මිගාර සිටුතුමාගේ පුත් වූ පූර්ණවර්ධන සිටුතුමා සමඟ විශාඛා දේවියගේ සරණ මංගල්‍යය සිදුවිය. මහා පින් ඇති විශාඛා කුමරියට පරම්පරාවෙන් උරුම වූ නව කෙළක් පමණ වටිනා මහලිය පළඳනාවක් තම පියා වූ ධනඤ්ජය සිටුතුමාගෙන් ලැබුණි. විශාඛා දේවියගේ බාල සොහොයුරු වූ මිගාර සිටාණෝ ද සෝවාන් ව මොක් මඟ පහස ලැබූ අයෙකි.

විශාඛාවන්ගේ නැණ ගුණ බලය ලෝ පරසිදු විය. ඇය පුත් කුමාරවරුන් දස දෙනෙක් හා දූ කුමරියන් දස දෙනෙක් ආදී ලෙසින් දරුවන් විසි දෙනකුගේ මවක් විය. ඒ කෙසේ වෙතත් ඇය තුළින් කිසිම විටෙක වයෝවෘද්ධ පෙනුමක් නොවීය. තුරුණු පෙනුම ම විය. පෙහෙවස් පිරීමෙහි නියැළුණු මහ උවැසියන් අතරින් විශාඛාවෝ ඉදිරියෙන් ම වූවා ය. ඒ වගේම ඇය තම මන්දිරයේ නිරතුරුව ම භික්ෂූන් වහන්සේ උදෙසා මහා දන් පූජා කළා ය.

විශාඛාවෝ තම පරම්පරාවෙන් උරුම වූ මහලිය පළඳනාව ඉතා විශාල මුදලකට අලෙවි කළා ය. විහාරයක් සෑදීමේ භූමිය ගැනීමට කහවණු නව කෙළක් ද, විහාරය සෑදීමට කහවණු නව කෙළක් ද, විහාරය පිදීමේ උළෙලට කහවණු නව කෙළක් ද වශයෙන් පූජා කළ ධනය කහවනු සත්විසි කෙළකි. එලෙසින් ගොඩනැඟූ විහාරය පූර්වාරාමය නම් විය.

එම විහාරයෙහි වැඩ නිම කොට ශාසනයට පූජා කිරීමෙන් අනතුරුව විහාරය වටකොට සතුටු සිතින් තම දරු මුණුබුරු, පිරිස් පිරිවරා සතුටු ගී ගයමින් හැසිරෙන අයුරු දැකීම මහත් වූ පුදුමගෙන දෙන සුළු විය.

කිසිම දිනක එවැන්නක් නොදුටු භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ, “ විශාඛා මහා උපාසිකාව තම දරු මුණුබුරු පිරිස් සමඟ විහාරය වටා සතුටු සිතින් ගී ගයමින් මේ හැසිරෙන ආකාරය කිමෙක් දැයි නොදනිමු’යි පවසා සිටියහ.

ඒ අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ විශාඛාවෝ ගයන ගීයක් නැත. පෙර පැතුම් ඉටු වී අග උවැසි තනතුරු ලැබීමෙන් හැඟුණු පසන් සිත පැතිරීමකැයි භික්ෂූන් වහන්සේට දේශනා කළ සේක.

**“යථා පි පුප්ඵරාසිම්හා
කයිරා මාලාගුණේ බහූ
ඒවං ජාතෙන මච්චේන
කත්තබ්බං කුසලං බහුං”**

“මල් රැසකින් බොහෝ මල් දම් ගොතන්නේ යම් සේ ද එසේ ම උපන් මිනිසා විසින් බොහෝ කුසල් කළ යුතු ය.”

යම් මල් කරුවකු විසින් වියළුණු, මැලවුණු, පණුවන් කෑ, පැල්ලම් ගැසුණු මල් තෝරා ඉවත දමා මනා වූ පැහැයෙන් හා සුවඳින් යුත් මල් රැසක් කැටි කොට බොහෝ මල්දම් තනන්නේ වේ ද එපරිද්දෙන් ම උපන්නා වූ මනුෂ්‍යයා විසින් බොහෝ කුසල් කටයුතුයි වදාළ සේක.

මනුෂ්‍ය ජීවිතයක් ලද අප ද, මේ ලැබූ ජීවිතය අර්ථවත් කර ගැනීමේ දී මල්කරුවා විසින් මැනවින් තෝරා ගන්නා වූ පැහැයෙන් හා සුවඳින් යුත් මල් සේ අප ද අපගේ ජීවිතයට මැනවින් කුසල් දහම් එකතු කර ගත යුතු ය. එවිට මේ ලැබූ මනුෂ්‍යත්වය වඩා අර්ථවත් වනු ඇත.

දීපා පෙරේරා



# ආධ්‍යාත්මික ගුණ විදහා දැක්වෙන

# අමරාවතී - ගුප්ත සම්ප්‍රදායන්හි බුද්ධ ප්‍රතිමා කලාව

**දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගෝදාවරී ගංගාව ආශ්‍රිතව ගොඩනැඟුණු ප්‍රබලතම රාජ්‍ය වූයේ ආන්ද්‍රා රාජ්‍යය යි. මෙම රාජ්‍යයට අයත් අමරාවතියේ ක්‍රිස්තු පූර්ව තුන්වන ශතවර්ෂයේ සිට ථෙරවාදී බුදුදහම ප්‍රචලිතව පැවතුණි.**

අමරාවතිය මහායාන බුදු සමයේ කේන්ද්‍රස්ථානයක් වූයේ ක්‍රිස්තු වර්ෂ දෙවැනි ශත වර්ෂය වන විට බව ඓතිහාසික කරුණු වාර්තා කරයි. ධර්මාශෝක රාජ්‍ය සමයේ මැනවින් බුදු බුදුදහම ව්‍යාප්ත වූ ආන්ද්‍රාවෙහි බොහෝමයක් බෞද්ධ සිද්ධස්ථාන ස්ථාපිත වූ අතර, දැනට නෂ්ටාවශේෂ බහුලව දක්නට ඇත්තේ මෙකී අමරාවතී සහ නාගර්ජුන කොණ්ඩ යන ස්ථානයන්හි ය.

අමරාවතී සම්ප්‍රදාය පිළිබඳ වඩාත් ප්‍රචලිත වූයේ එහි ස්ථාපිත ප්‍රසිද්ධ මහා චෛත්‍යය පදනම් කරගෙන ය. ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන් දෙකට වඩා මෙම බුදුපිළිම කලාවේ යම් පරිණත භාවයක් තිබෙන බව විද්වත් මතයයි. අමරාවතී සම්ප්‍රදායට අදාළව පිළිම නිර්මාණය කරන නිර්මාණකරුවා අමුද්‍රව්‍ය ලෙස යොදා ගෙන ඇත්තේ කොළපාට හුණු ගල් විශේෂයක් බව සඳහන් වේ. අමරාවතී සම්ප්‍රදායට අයත් පිළිමවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ භාව ප්‍රකාශනය ඉතා උසස් මට්ටමක පැවතීමයි. ඊට අමතරව

- සිත් ඇදගන්නා සුළුබව,
- ස්වභාවොක්තියට මුල්තැන දීම
- ඉතාම ප්‍රසන්න බවකින් යුක්ත වීම
- ආධ්‍යාත්මික ගුණයන් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම

වැනි දෑ දක්නට ලැබේ. ආන්ද්‍රා බුදු පිළිම කලාවේ ද මථුරා සම්ප්‍රදායෙහි මෙන් රවුම් මුහුණ, විවෘත වූ නෙත් දක්නට ලැබේ. කේශ කලාපය ද මෙම පිළිම සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණයකට පිහිටා ඇත.

දේහ ලක්ෂණවලට අමතරව චීවරය ගැන සැලකීමේ දී මෙම බුද්ධ රූපයන්ගේ ඇතුළත් චීවරය ඉහළ සිට පාදාන්තය දක්වා වැටුණු ඉතා සියුම් රැළිවලින් යුක්ත ය. තවද මථුරා සම්ප්‍රදාය තුළ පැවති බුදු



පිළිමවල දක්නට ලැබෙන සිවුරු පටිය අමරාවතී සම්ප්‍රදායේ පිළිමවල දක්නට නොලැබෙයි.

මුල් කාලයේ නිර්මාණය වූ පිළිමයන්හි ඒකාංශය නිරූපණය වුව ද පසු කාලයක නිර්මාණය කරන ලද ප්‍රතිමාවන් තුළ උභයාංශ නිරූපණය දක්නට ලැබේ. උදාහරණයක් ලෙස නාලාගිරි දමනය තුළ දැක්වෙන බුදුරුව පෙන්වා දීමට පුළුවන. එමෙන්ම මෙම පිළිමයන්ගේ අඳනය හෙවත් සංඝාටිය යම්තමින් පෙනෙන්නට ඇත.

මේ අයුරින්ම දක්වන ලද අමරාවතී හෙවත් ආන්ද්‍රා සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ සහිතව නිර්මාණය වූ බොහෝ ප්‍රතිමා භාරතය, ලංකාව, ඉන්දුනීසියාව. වියට්නාමය, තායිලන්තය වැනි බොහෝ ප්‍රදේශවලින් හමුවී ඇත. අමරාවතී සම්ප්‍රදායට අනුකූලව නිර්මාණය වූ ප්‍රතිමා අතරින් අමරාවති පුදබිම ආශ්‍රිතව නාගර්ජුණ කොණ්ඩ නම් ප්‍රදේශයේ ප්‍රතිෂ්ඨාපිත අමරාවතී බුදු පිළිම වහන්සේ ප්‍රමුඛ ස්ථානයක් ගනී. බුදුපිළිමය හොඳින් නිරීක්ෂණය කරන විට අමරාවතී සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ මනාව විද්‍යමාන වේ.

මීට අමතරව ලංකාවේ ප්‍රතිෂ්ඨාපිත අවුකන පිළිම වහන්සේ, රැස්වෙහෙර, මාලිගාවෙල, පබළු වෙහෙර ස්ථානයන් හි පිහිටි බුදු පිළිම වහන්සේ මෙම සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ ගෙනහැර දක්වයි. අමරාවතී සම්ප්‍රදායට අදාළ බොහෝ ප්‍රතිමාවන්හී හස්ත මුද්‍රාව ලෙස අභය මුද්‍රාව දක්වා ඇත. එමෙන්ම අනිත් අතින් උරහිස ආසන්යේ සිවුරු පොට ස්පර්ශ කොට ගෙන සිටින අයුරු දක්වා තිබේ.

මේ අයුරින් අමරාවතී සම්ප්‍රදායට අයත් බුදු පිළිම වහන්සේ රැසක් ලංකාද්වීපය තුළ හමුවේ.

ලංකාව තුළ දක්නට ලැබෙන අමරාවතී සම්ප්‍රදායට අයත් බෙහෝ ප්‍රතිමා හුණුගල්, පාෂාණ, වැලි බදාම වැනි අමු ද්‍රව්‍ය භාවිතයට ගෙන නිර්මාණය කළ ද අමරාවතී සම්ප්‍රදායට අවේණික ලක්ෂණ නියෝජනය කරමින් ලෝකඩ භාවිත කර නිර්මාණය කරන ලද ප්‍රතිමා විශේෂයක් ද පුරාවිද්‍යා ගවේෂණවලින් ලංකාවේ විවිධ ප්‍රදේශවලින් සොයා ගෙන ඇත.

මෙලෙස ලෝකඩ වාත්තු කොට නිර්මාණය කරන ලද ප්‍රතිමා අතර අභ්‍යන්තර කුහර සහිත ප්‍රතිමා හා අභ්‍යන්තර කුහර නොමැතිව වාත්තු කරන ලද ඝන ලෝකඩ පිළිම වහන්සේ ද නිර්මාණය වී ඇති බව පෙනේ. ඝන වාත්තු ක්‍රමයට අනුව නිපදවන ලද හොදම රන් ආලේපිත ලෝකඩ ප්‍රතිමාවක් වෙහෙරගලින් හමු වී ඇත.

## ගුප්ත සම්ප්‍රදාය

භාරතීය කලා සම්ප්‍රදායන්ගේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන්නේ ගුප්ත යුගයයි. ක්‍රිස්තු වර්ෂ 230 සිට 600 දක්වා ශත වර්ෂ කිහිපය ගුප්ත රජ දරුවන් විසින් පාලනය කළ අතර, එය ගුප්ත යුගය ලෙස සැලකේ. ගුප්ත කලා යුගය යනු ගන්ධාර මථුරා සම්ප්‍රදායයන්ගේ සංකලනයක් වේ.

සම්ප්‍රදායයන් දෙකේම ආභාසය නිසාවෙන් දෝ මෙම යුගය තුළ බිහිවූ කලා කෘතීන්හි අඩුපාඩු විරල වන බවක් විද්‍යමාන වේ.

*ඉතිරිය 06 පිටුවට ...*

05 පිටුවෙන් ...

ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන් ඒ ඒ ප්‍රදේශවලට සීමා වුව ද ගුප්ත යුගයෙන් ඇති වූ ප්‍රබෝධය භාරතයෙන් බැහැරට ද සංක්‍රමණය වීම සිදුවිය.

මෙම කාලවකවානුවේ දී බුදුපිළිම නිර්මාණය කරනු ලැබූ කලාකරුවා තම ප්‍රතිමාකරණය කොට ඇත්තේ ත්‍රිපිටක ගත කරුණු අනුව බුදුරදුන්ගේ රූප ශෝභාව මනාව වටහාගෙන ය.

මෙහි දී ගාන්ධාර, මථුරා යන සම්ප්‍රදායට වඩා බුදුරදුන් සතුව තිබූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හුවා දැක්වීමට උත්සුක වී ඇති බව පෙනේ.

ගුප්ත යුගයේ බිහි වූ බුද්ධ ප්‍රතිමාවන්හි ආවේණික විශේෂ ලක්ෂණ බොහෝමයක් ඉතිහාසඥයන් විසින් විවිධ අවස්ථාවන්හී ගෙනහැර දැක් වූ අතර ඒ අතරින් කිහිපයක් පහත පරිදි වේ.

- කඩවසම් පෙනුම
- මුහුණේ ශාන්ත බව
- අඩවන් දෙනෙත
- මද සිනහව
- සිවුර දෙවුර වසා සිටීම
- චීවරයේ සිහින් රැළි
- ධර්ම චක්‍ර මුද්‍රාව
- සජීවී බව

යන ආදී ලක්ෂණ මේවායේ දක්නට ලැබේ. ගුප්ත කලාකරුවා සැම විටම උත්සාහ ගෙන ඇත්තේ බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ දැක්වීම හා ආධ්‍යාත්මික ගුණය දැක්වීමට ය. එමෙන්ම මෙම කලා සම්ප්‍රදාය තුළ පැවති තවත් විශේෂ ලක්ෂණයක් ලෙස බුදුරදුන්ගේ





චර්යාවේ විවිධ අවස්ථා දැක්වීම සඳහා විවිධ මුද්‍රා භාවිතය පෙනේ.

ප්‍රතිමා වැඩි වශයෙන් වැලි ගල්වලින් නිර්මාණය කර ඇති අතර, ගඩොල් හා ලෝහ වර්ග භාවිත කොට ගනිමින් ද බුද්ධ ප්‍රතිමාකරණයේ යෙදී ඇති බව පෙනේ. මෙම යුගයේ නිර්මාණය කරන්නට යෙදුණු හිඳි පිළිම හා හිටි පිළිම කිසිදු වෙනසක් නොමැතිව එක හා සමානව ප්‍රේක්ෂක ජනාදරය දිනා ගැනීමට හැකි වීම විශේෂ ලක්ෂණයකි. එයට හේතු වන ප්‍රධාන සාධකය වශයෙන් සැලකිය හැක්කේ ගුප්ත සම්ප්‍රදාය තුළ ප්‍රතිමාකරණය කිරීමේ දී අනුගමනය කරන ලද පරිමාණ, දිග, පළල, මුද්‍රා,

ආයතන ආදී නියමයන් කිසියම් ශාස්ත්‍රානුකූල ක්‍රමයකට සකස් වී තිබීමයි.

මේ හේතුවෙන් අනිකුත් සම්ප්‍රදායන් තුළ දී වූ ප්‍රතිමාවන්ට වඩා මෙම ප්‍රතිමාවන් තුළ ශිල්පීය නිපුණත්වයක් දක්නට හැකියාව පවතියි. මෙලෙස ගුප්ත සම්ප්‍රදාය තුළ බිහිවූ බුද්ධ ප්‍රතිමාවන්හි විශිෂ්ටත්වය දැක්වීම සඳහා ගත හැකි හොඳම උදාහරණය නම් සාරානාත්හි ධර්ම චක්‍ර මුද්‍රා හිඳි පිළිමයි.

ඊට අමතරව මතුරා පුරාවිද්‍යා කටුගෙයි ඇති ජමල්පූර් පිළිමය, මන්කුමාර් අභය මුද්‍රා හිටි පිළිමය යන ආදිය දැක්වීමට හැකි ය.

ගුප්ත යුගයේ නිර්මාණය වූ බුදු පිළිම සමස්තයක් වශයෙන් බලන කල තවත් සුවිශේෂී ලක්ෂණ රාශියක් පෙන්වා දී ඇත. එහි ද චාම් බව ප්‍රධාන වේ. රාජකීය ස්වරූපය පෙන්වීමට නොව බුදුරජාණන් වහන්සේ සතු වූ ආධ්‍යාත්මික ලක්ෂණය හුවාදැක්වීමට කලාකරුවා උත්සුක වී ඇත.

එමෙන් ම වෙනත් සම්ප්‍රදායයන්ට අදාළ ප්‍රතිමාවලට සාපේක්ෂව ගුප්ත සම්ප්‍රදායට ඇතුළත් ප්‍රතිමාවන්හි දක්නට ලැබෙන අනෙක් විශේෂ ලක්ෂණ නම් ඉහළ භාව ප්‍රකාශන ශක්තියක් මෙම ප්‍රතිමාවන් තුළ ගැබ්වී තිබීමයි.

හෝකන්දර බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන විහාරවාසී,
**කොත්මලේ පඤ්ඤකිත්ති හිමි**

# ජීවිතයට හිමි නියත කෙළවර

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් මහා වෙහෙරෙහි වැඩ වසන සේක. දවල් කාලයේ කොසොල් මහ රජතුමා භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ වැඳ නමස්කාර දක්වා පසෙකින් අසුන් ගත්තේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ,

"මහරජ" ඔබ කොහේ සිට පැමිණියේ දැයි විමසූ සේක.

එවිට රජතුමා භාග්‍යවතුන් වහන්ස "මාගේ මිත්තණිය වර්ෂ එකසිය විස්සක් ආයුෂ භුක්ති වින්දා ය. ඈය මට ඉතා ප්‍රිය විය. කුඩා කල මා ආදරයෙන් බලා ගත්තා ය. එහෙත් ඈය මිය ගියා ය. ඉතින් භාග්‍යවතුන් වහන්ස මම ඉතා කනගාටුවෙන් සිටිමි. ඇයට නැවත ප්‍රාණය ලැබෙනවා නම් මාගේ ඇත් රුවන්, නැත්තම් අශ්වරුවන් නැති නම් ගම්වරයක් නැති නම්, ජනපදයක් වුවත් දෙන්නමි." යනුවෙන් කඳුළු පිරි දෙනෙතින් යුතුව පැවසුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ, "රජතුමනි," දුක් වීමෙන් පලක් නැත. සියලු සත්වයෝ මරණය ස්වභාවය කොටගෙන පවතී. ඔවුන් මරණයෙන් මේ ආත්මය අවසන් කරයි. උපන් සියල්ලෝ ම මිය යති.

සබ්බේ සත්තා මරිස්සන්ති
මරණං තං හි ජීවිතං
යථා කම්මං ගමිස්සන්ති
පුඤ්ඤ පාප ඵලු පගා
නිරයං පාප කම්මන්තා
පුඤ්ඤ කම්මාච සුග්ගතිං



සියලු සත්වයෝ මිය යති. ජීවිතය මරණය කෙළවර කොට ඇත. එහෙයින් පින් පව් අනුව ගියාහු, පින්කළ ඇත්තෝ සුගතියට ද, පව් කළ ඇත්තෝ දුගතියට ද යන්නාහ.

ගාල්ල දංගෙදර, ශ්‍රී ජයවර්ධනාරාම පුරාණ මහා විහාරාධිකාරී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක
**මුතුකණ්ඩියේ සුනෙත්ත හිමි**

# සිතක මහිම


මහණෙනි, මෙ
ලොව ද්වේෂයෙන් (තරහෙන්)
දූෂිත වූ සිත් ඇත්තෙක් කලුරිය කරයි
නම්, හිසින් ගෙනෙන ලද්දක් ඒකාන්තයෙන් ම
බහා තබන්නාක් මෙන් ඒ පුද්ගලයා ඒකාන්තයෙන් ම
නිරයෙහි උපදින්නේ යැයි මම මගේ සිතින් ඔහුගේ සිත
පිරිසිඳ දනිමි.ඒ, කුමක් නිසා ද යත් මොහුගේ සිත ද්වේෂයෙන්
දූෂිත බැවිනි.

මහණෙනි සිත දූෂිත වීම් හේතුවෙන් මරණින් මතු (සැපතින් තොර බැවින්) අපාය නම් වූ ද (නපුරු ගති ඇති බැවින්) දුගති නම් වූ ද, විනිපාත නම් වූ නිරයෙහි උපදින්නේ ය.

මහණෙනි, මම පහන් සිත් ඇති පුද්ගලයකු ගැන මගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි. මේ පහන් සිත් ඇති පුද්ගලයා මේ කාලයෙහි කලුරිය කරන්නේ නම් හිසින් ගෙනෙන ලද්දක් බහා තබන්නාක් මෙන් ස්වර්ගයෙහි උපදින්නේ ය. එයට හේතුව වන්නේ ඔහුගේ චිත්ත ප්‍රසන්න භාවයයි.

මහණෙනි චිත්ත ප්‍රසන්න බව හේතුකොට මෙලොව ඇතැම් සත්වයෝ මරණින් මතු සුගති (සැපතට ගති වූ හෙයින්) නම් වූ ස්වර්ගලෝකයෙහි උපදිති.

***සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සිංහල අංගුත්තර සඟිය ඇසුරිනි.***



# ලෝකයට දියහැකි අනර්ඝතම වස්තුව

# නිර්මල බුදුදහමයි

උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

**එක්සත් රාජධානියේ ප්‍රධාන සංඝනායක ස්කොට්ලන්ත බෞද්ධ විහාරාධිපති ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ විශ්‍රාමික කථිකාචාර්ය රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති විද්‍යාපති**

## කඹුරාවල සිරි රේවත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.



**කෙළිලොල් ළමා වයසට විරාමයක් තබමින් කුල කුමරුවකු ලෙස කල් නොයවා පාරිවේණික හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවේදී තම බහුශ්‍රැත ව්‍යක්තභාවය ප්‍රදර්ශනය කරමින් දේශනයක් පැවැත්වීම දක්වා ආ ගමන් මග පිළිබඳ අතීතාවර්ජනයක යෙදෙමින් සාකච්ඡාවට ප්‍රවේශ වෙමු අපේ හාමුදුරුවනේ,**

සංසාරගත පුණ්‍ය ශක්තියට අනුව පුරණ ලද පාරමී බලයෙන් උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ උත්තරීතර පැවිදිබව ලබා ගැනීමටත් පෙර කෙළි ලොල් ළමා වියේදී ම විහාරස්ථානය කෙරේ බොහොම ලැදියාවෙන්, ගෞරවයෙන් කටයුතු කළ නිසාම කුඩා අවධියේ සිටම සසුන් බඹසර රැකීමට පෙළඹීමක් තිබුණ බව අතීතය සිහිපත් වෙන විට වැටහෙනවා.

ඒ අනුව ගුණවර්ධන අමරසේකර මහෝපාසකතුමා, කුසුමා අමරසේකර මහෝපාසිකා මාතාව යන ශ්‍රද්ධා බුද්ධිසම්පන්න සද්ගුණවත් මව්පිය දෙපළගේ ආශිර්වාදය ඇතිව බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙන් විහාරාධිපති බස්නාහිර පළාතේ උප ප්‍රධාන සංඝනායක මාලේවන පුණ්‍යරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ලබුගම ශ්‍රී ලංකානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහානායක ධූරන්දර බෙල්ලන ඥානවිමල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් කඹුරාවල රේවත යන ශාසනික නාමයෙන් වයස අවුරුදු 10 දී උතුම් පැවිදි බිමට පත්වුණ බවත් පුණ්‍යානුමෝදනා පූර්වකව කෘතවේදීව සිහිපත් කළ යුතුයි.

පැවිදිවීමෙන් අනතුරුව බෙල්ලන ශ්‍රී ධර්මපාල මහ පිරිවනේ පණ්ඩිත උපාධිය දක්වා ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගනිමින් 1992 වර්ෂයේ දී උසස්පෙළ විභාගයෙන් ලංකාවේ වැඩිම ලකුණු ලබා ගත් ශිෂ්‍යයා ලෙස පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව සංස්කෘත විශේෂ උපාධිය ලබා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයෙන් බෞද්ධ දර්ශනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට කටයුතු කළා. මෙම කාල පරිච්ඡේදය වන විට නිසි වයස් සම්පූර්ණව සිටි නිසාම පූර්වෝපචිත කුසලශ්‍රීයෙන් විරාජමානවෙමින් 1991 වර්ෂයේ දී ජූලි මස 22 වැනි දින කෝට්ටේ රාජමහා විහාර උපෝෂථාගාරයේ දී සුපරිසුද්ධෝපසම්පදාව ලබා ගැනීමට තරම් භාග්‍යවන්ත වුණා. ඒවගේම 2000 වර්ෂයේ දී බෞද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන 2003 වර්ෂයේ දී ස්කොට්ලන්ත Strachlyde විශ්ව විද්‍යලයෙන් අධ්‍යාපනපති උපාධිය ලබා ගත්තා. අනතුරුව අන්තර් ආගමික අධ්‍යාපනය සඳහා ගුරුවරුන් පුහුණු කිරීම පිළිබඳ ස්කොට්ලන්ත විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හදාරමින් උතුරු වේල්ස් බැන්ගර් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධිය සඳහා සතිපට්ඨාන භාවනාව පිළිබඳ පාඨමාලාව හැදෑරුවා. ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු කරමින් 2008 වර්ෂයේ දී ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ බෞද්ධ උපදේශකවරයකු ලෙස බෞද්ධ දර්ශනය පිළිබඳ පාඨමාලාවක් හඳුන්වා දුන්නා. 2007 වර්ෂයේ දී ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවේ බෞද්ධ උපදේශක වශයෙන් පත්ව 2009 වර්ෂයේ දී ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව ඇමතූ ප්‍රථම ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ වශයෙන් දසරාජ ධර්මය මුල්කරගත් බෞද්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ දේශනයක් සිදුකළා.

**එක්සත් රාජධානියේ ප්‍රධාන සංඝනායක ධූරය දරමින් ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ස්වාමීන්ද්‍රයන් වහන්සේ වශයෙන් දේශීය මෙන්ම විදේශීය වශයෙන් සිදුකළ ධර්ම ශාස්ත්‍රීය, ජාතික,ආගමික, ශාසනික හා සමාජමය කටයුතු පිළිබඳවත් සඳහන් කරන්න නායක හාමුදුරුවනේ,**

ථේරවාදී බෞද්ධ විහාරස්ථානයක් නොතිබුණ ස්කොට්ලන්තයේ පළමු වතාවට ථේරවාදී බෞද්ධ විහාරස්ථානයක් ආරම්භ කළා වගේම ස්කොට්ලන්තයේ පාසල් ගුරුවරුන්ට බුදුදහම ඉගැන්වීම පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වුවා. ධම්මපදය ඇසුරින් වේදිකා නාට්‍ය නිර්මාණය කර අමෙරිකාව තුළ ප්‍රචාරය කළා. සතිපට්ඨාන භාවනාව මානසික රෝගීන්ට ප්‍රතිකාර වේදයක් ලෙස යොදාගෙන ජපානය තුළ වැඩමුළු පවත්වමින් ඊශ්‍රාලය,පලස්තීනය ,ස්පාඤ්ඤය ආදී රටවල අන්තර් ආගමික වැඩසටහන්වල දී බුදුදහම නියෝජනය වන ආකාරයෙන් කටයුතු කළා. ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු, බෞද්ධ උපදේශකවරයකු,හා ස්කොට්ලන්ත පාර්ලිමේන්තු ආගමික කටයුතු උපදේශක සභාවේ බෞද්ධ උපදේශකවරයකු වශයෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළා.

ලංකාව සුනාමි විපතට පත්වූ අවස්ථාවේ ස්කොට්ලන්ත රජයේ ආධාර ලබාගනිමින් ගාල්ල,මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල මනෝඋපදේශන සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යමින් ස්වයං රැකියා පුහුණුව එයට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ලබාදෙමින් රැකියා සඳහා අධාර ලබාදීම් සිදුකළා. ආර්ථික අපහසුතා ඇති දරුවන්ට ශිෂ්‍යත්ව ක්‍රමයක්, පෙර පාසල් අධ්‍යාපනය , බෙල්ලන ළමා සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කළා. 2010 වර්ෂයේ දී ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව ලංකාවේ බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ ශාඛාවක් ආරම්භ කරමින් එහි අධිපති වශයෙන් කටයුතු කරමින් බෙල්ලන ධර්මපාල මහ පිරිවනේ පරිවේණාධිපති වශයෙන් කටයුතු කරමින් පිරිවෙන තුළ විදේශීය ධර්ම ප්‍රචාරක භික්ෂූන් වහන්සේලා පුහුණුකිරීම් සිදුකරනවා.ඒවගේම හරිත සංකල්පය යටතේ හරිතවත්කමත් සමඟ කුඩා කාලයේ සිටම ආගමට දහමට සමීප සතා සිවුපාවාට ගහකොළට ආදරය කරන දරුවකු ගොඩනැඟීමේ වැඩ පිළිවෙළ සමාජ සේවයක් ලෙස සිදුකරගෙන යනවා. ඒඅතරට මනෝකාය ගුප්තාකර්ෂණ සහ අන්තරාභවය, නැණ විමල නැණ පහණ, මයින්ඩ් පුල් ජර්නි ආදී කෘති ශාස්ත්‍රීය ලෝකයට දායාද කළා.


සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකළ මහානීය සේවාව ඇගයීමට පාත්‍රකරමින් කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව වෙතින් එක්සත් රාජධානියේ සංඝනායක ධූරයෙන් පිදුම් ලැබුවා.

**පාලි,සංස්කෘත, ප්‍රාකෘත, සිංහල,ඉංග්‍රීසි වැනි භාෂා හැදෑරූ වියත් පඬිරුවනක් වශයෙන් ඔබ වහන්සේ ලබා ගත් අද්දැකීම් අනුව ආධුනික ධර්ම දූතයන් වහන්සේ පුහුණු කළ යුතු ආකාරය පිළිබඳ දරන ආකල්පය පැහැදිලි කරන්න හාමුදුරුවනේ.**

ලංකාවේ තිබෙන පිරිවෙන් අධ්‍යාපනය තුළින් ලොකු පන්නරයක්, ශක්තියක් ලැබෙනවා. ඒවුණාට අවුරුදු 20 ක් අන්‍ය ආගමික රටක ධර්ම ප්‍රචාරය තුළින් ලබාගත් අද්දැකීම් සමුදාය අනුව පිරිවෙන් අධ්‍යාපනය තුළින් ලබාගත් අධ්‍යාපනය බටහිර රටවලට රැගෙන යාමේදී කොතෙක් දුරට එම තත්ත්වය උපකාරවත් වෙනවා ද? කොතෙක් දුරට වර්ධනය කරගෙන ඔපවත් කරගත යුතු ද? භික්ෂූන් වහන්සේට කෙතරම් දහම් දැනුමක් තිබුණත් එම දැනුම ලබා දෙන්න කොතෙක් දුරට භාෂාමය නිපුණතාවක් තිබෙනවා ද? ඉතා වැදගත් කරුණක්. ලංකාවෙන් ලෝකයට දියහැකි අනර්ඝ වස්තුව නිර්මල බුදුදහම නම්, එය ලබා දීමට අපි තරුණ භික්ෂූන් වහන්සේලා පුරුදු පුහුණු කරන්න අවශ්‍යයි. මම වගේම වසර 20,30 අද්දැකීම් තිබෙන, ලෝකය බබළවන ජාත්‍යන්තර ආයතන ගොඩනැගූ බොහෝ ධර්මදූත ස්වාමීන් වහන්සේලා වැඩ සිටිනවා. වසර ගණනාවක් ධර්ම ප්‍රචාරය කළ ස්වාමීන් වහන්සේලාගේ අද්දැකීම් එකතුව ලංකාවේ සිටින සාමණේර භික්ෂූන් වහන්සේලා සමඟ බෙදා හදාගෙන විධිමත් සැලැස්මක් ඇතිව ඉදිරියට යා හැකි වැඩ සටහනක් කරන්න බලාපොරොත්තු වෙනවා.

පොදුවේ ඉංග්‍රීසි භාෂාමය දැනුම ලබා දීමෙන් උන්වහන්සේලාට අදාළ රටේ භාෂාව ඉක්මනින් ග්‍රහණය කරගත හැකියි. ඒවගේම භාවනාව බටහිර ලෝකයට අවශ්‍ය නිසා භාවනාවෙන් පරිපූර්ණ අද්දැකීම් ඇති කුඩා කල සිටම හොඳින් භාවනාව පුරුදු පුහුණු කළ ආධ්‍යාත්මික ශක්තියක් දියුණු මනසක් ඇති ප්‍රායෝගික අද්දැකීම් සහිත ,හොඳ භාෂා ශක්තියක් සමඟ, ත්‍රිපිටකය හොඳින් අධ්‍යයනය කළ භික්ෂු පරපුරක් අප ලෝකයට දායාද කිරීමට කටයුතු කිරීම වර්තමානය තුළ කළ යුතු සේවය යි.

**හේමමාලා රන්දුනු**



# පහන් සිතක කවි



සංස්කරණය
දීපා පෙරේරා

## සිත නිවෙන තැන

පන්සල් බිම ම ඇතිරුණු ගල්  තලාවයි
බැලු බැලු අතින් හැම තැන තුරු  ලතාවයි
දලු ලා වැඩුණු බෝධිය හරි  කලාවයි
පන්සල් බිම කාගෙත් සිත්  නිවාලයි

බෝ මැඩ සෙවණෙ මොහොතක් කල් ගෙවන විට
පන්සල් බිම පුරා සක්මන්  කරන විට
මගෙ පොඩි කුටියෙ හිඳ විදසුන්  වඩන විට
නැත කිසි පාලුවක් අරමෙහි  හිඳින විට

ගම කෙළවරයි පන්සල් බිම  තියෙන්නේ
චිත්ත විවේකාරාමය  කියන්නේ
එන සැම දෙනාගෙ ම තුන් සිත  නිවෙන්නේ
ඒ නිසයි පන්සලට මේ නම  කියන්නේ

පන්සල් බිමට මේ ලස්සන නම  දුන්න
එය ඉදිකරන්නට සහයෝගය  දුන්න
මට නිදහසේ වැඩ ඉන්නට ඉඩ  දුන්න
සැමට ම පතමි නිවනට මඟ පෑ  දෙන්න

**ඉංගිරියේ සීලරතන හිමි**
**චිත්ත විවේකාශ්‍රමය**

## දහම් මඟට පැමිණේවා



පන්සාළිස් වසක් පුරා
ලොවට දම් කඳ දෙසා
පිරිනිවනට පෑ බුදු හිමියනි
ලොව විසූ බොහෝ දන
ශ්‍රී සදහම් අසා
මඟ ඵල ලැබුවා.
දෙව් ලොවට  ගියා
නිරයෙන් ගැලවුණා
හුඟක් කුසල් කරලා
මග ඵල ලබන්නට
දෙව් බඹු මිනිස් ලොව
ඉපදෙන්නට හැමෝ'ට ම
හැකි  වේවා කියා පතනවා.

**එල්.පී.ඩී. සදීෂ් නෙතුෂ**
**බණ්ඩාර**


## පොසොන් සඳ

තිස්ස තිස්ස හඬ  ඇසුණා
මගෙ නම කියන්නෙ කවුදැයි  බැලුවා
දෙව්පෑ නිරිඳුන් සදහම්  ඇසුවා
දුනු ඊතල බිමට දමා දොහොත් මුදුන් දී  වැන්දා

පොසොන් පෝදා දෙවන බුදුන් ලක් දෙරණට  වැඩම කළා
දහමින් ලක් මව පෝෂණය  කළා
පොසොන් සඳ කිරණ ලක්දිව එකලු  කළා
අනුබුදු මිහිඳු මා හිමි ගුණ සමරමු  සැමදා

**මානෙල් කිරිවන්දල**
**රතනසාර දහම් පාසල ඊරියවැටිය**

## මෙතේ බුදු හිමියනි



මෙත් මුනි සමිඳේ ....
මධුර මනෝහර
මුනි බණ පදයක්
අහන්න
වැඳ වැටිලා
අවසර නැතිවෙද
මතු ලොව බුදුවන
අප මහා සම්බුදු
මෙත් මුනි සමිඳේ.....

සතර දෙසින්
ඇවිලෙන දුක් ගිනි දැල්
දවමින් මා පසුපස එන්නේ
බිහිසුණු ගිනි දැල්
කෙලෙස නිවන්න ද
නැත මා හට නම්
වැටහෙන්නේ
නිම නැති මේ සසරේ
අප මහා සම්බුදු
මෙත් මුනි සමිඳේ.....

දුක් ගිනි නිවනා
බුදු බණ අසනට
මා පැමිණෙන දා
දෙව්රම සොයලා
සසරින් එතෙරට
යන්නට සිතකට
පින් සිත් වැඩිල ද
දෙසනු මැනවි මට
සමාවෙලා
අප මහා සම්බුදු
මෙත් මුනි සමිඳේ......

බුදු බණ අහලා
සිත මගෙ නිවිලා
අනන්ත ගුණයෙන් සැනසීලා
නිවන් පුරේ සුව විඳිනට අවසර
සසරින් එතෙරට පිය මැනලා
අප මහ සම්බුදු
මෙත් මුනි සමිඳේ....

**නීතිඥ කීර්ති කපුවත්ත**
**රිදීගම**

## අමා දම් මිහිර

පව්වෙන් මිහින්තල සදහම් ගඟුල  ගලා
හෙළයේ දනන්ගේ සිත් පින්  පුරවාලා
සිවුපා සියොත් කැළ පණ නල රැකෙනු  බලා
අනුබුදු සමිඳු හෙළ අභිමන් ජනිත  කළා

අමා දම් රසෙන් ඔකඳ ව බොදු දනන්  සිතුම්
මිහින්තලාවෙන් ඇරැඹේ සදහම්  උතුම්
පන්සල විහාරේ දන් සිල් බවුන්  වැඩුම්
අනුබුදු මිහිඳු හිමි සමරා තුම්  පින්කම්

පොසොන් සඳ කිරණ සමඟින් ලොව  නැහැවූ
සිව් සැට කලා අගනා මිණිමුතු  දිස් වූ
දෑස් පුබුදවා සදහම් වෙත  හැරවූ
නමදිමි ඔබෙ දෙපා හිමියනි  අනුබුදු වූ

**ජයරත්න ගමගේ**
**පිළියන්දල**



## වෙනස් වීම

සම්බුදු පිරි නිවුම සිදුව
වසර දෙතිස් හයක් ඉක්ම
මිහිඳු සමිඳු සදහම් ඔසු
සිරි ලක් මව වෙතට ගෙනේ

දෙව් පියතිස් රජු හා දන
තෙරුවන මනුදම් අතරට
දුනු ඊතල බාල සිතුම්
වහල් දාස ගති ඉවතට

දාගැබ් මහ පිළිම ථූප
මහ වැව් වන උයන් තැනේ
සුදු සළු පිළි සැරසී පිරිස
සැඳෑවෙ වෙහෙරෙහි
ගැවසේ.

සාධු නාද පිරිත් සරින්
වැඩිහිටි මනුදම් පළවේ
දන් සැල් මහ පින්කම් සැම
ගම් බිම්වල නිති සිදුවේ

වැලි මලුවේ දිගු කොඩිවැල්
සිලි සිලියකි බෝ සෙවණේ
සාර සසුන් පිළිවෙත් දැන
සමහරු විදසුන් ගත වේ

**ආචාර්ය**
**ස්වර්ණා විජේසිරිවර්ධන**
**සමරවික්‍රම**
**තලවතුගොඩ**

## සුජාතා සිටුදියණිය



මෙම කප පතළ දඹදිව මහ නුග  ගසකී
හැම දෙන පුදන නමදින රුක් දෙවි  කෙනෙකී
නම ගිය සුජාතා නම් සිටු  දියණියකී
දරුවකු ලැබීමට පුදකළ  භාරයකී

**අයි.පී. සෝමවීර**

## සසර...



භවයෙන් භවය සත සසරේ ගමන්  යත
කළ කම් අනුව ජීවිතයක් ලැබී  ඇත
සිරුරක් සමඟ ඇත ඒ හා බැඳුණු  සිත
නම් රූ දහම් හැර එහි වෙන කිසිත්  නැත

**වත්තේගම දේවානන්ද හිමි**

## මෙත් මල් පිපිලා

හිරු නැඟිටින්න පෙර අලුයම අවදි  වෙලා
සිල් රැකීමට සුදුවතින් සැරසී පන්සල වෙත පිටත්  වෙලා
පරුෂ වචන නෑ මුවග නිවුන වදන් ඇත  රැඳිලා
දුදන ගති වෙන් වෙලා සිත් තුළ මෙත් මල්  පිපිලා

**පානදුර අරුක්ගොඩ ඩබ්.පී. ඉන්ද්‍රානි**



බුදුසරණ
පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :– ..............................................................
ලිපිනය :– ..............................................................
දුරකථන අංකය :– ..............................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.



# සැප ලැබීමේ නිදානය

**සූත්‍ර පිටකයේ, පිළිවෙළ කතා යන යෙදුම බොහෝ තැන්හි සඳහන් වේ. ආනුපුබ්බ කතා යනු ද පිළිවෙළ කථා යනුවෙන් අර්ථ ගැන්වෙයි. බුදුරජාණන් වහන්සේගේ ධර්මය මනුෂ්‍ය ධර්මයකි. සත්ත්ව ලෝකයේ වෙනත් කිසිම සතකුට නැති උසස් මනසක් මනුෂ්‍යයාට හිමි ය.**

එහෙයින් මිනිසත් බව යනු කුමක්ද? එසේ උසස් මනසක් ඇති මිනිසාට මනුෂ්‍යත්වයේ සිට උත්තර මනුෂ්‍යත්වය වෙත එනම්, සෝතාපන්න ආදි මාර්ග හා ඵල ලැබීම වෙත යා හැකි වන්නේ කෙසේද? යන ඉගැන්වීමක් දේශනා කොට ඇති නිසා මේ දහම මනුෂ්‍ය දහමක් ලෙස හැඳින්විය හැකි ය.

කිසිම ජාතියකට, කිසිම රටකට, කිසිම භාෂාවකට මෙම ධර්මය සීමා වී නොමැත. මනුෂ්‍යත්වය ලැබූ, ලොව වසන ඕනෑම කෙනකුට ඔබින දහමක් හෙයින් ද මේ ධර්මය මනුෂ්‍ය ධර්මයකි.. එමෙන්ම මනුෂ්‍ය ධර්ම නැති කිසිවකුට හෝ උත්තර මනුෂ්‍ය ධර්ම වෙත ළඟා විය නොහැකි ය.

මේ දහම ශ්‍රාවකයා වෙත දේශනා කිරීමේ දී තථාගතයන් වහන්සේ අනුගමනය කළ පිළිවෙත "පිළිවෙළ කථා" වශයෙන් හැඳින්විය හැකි ය. පටිසෝතගාමී මඟෙහි යාමට තම ශ්‍රාවකයා කැමැත්තක් දක්වන්නේ නම් බුදුරජාණන් වහන්සේ මේ පිළිවෙළ කථා ක්‍රමය බොහෝවිට අනුගමනය කළ බව ත්‍රිපිටක ධර්මයේ සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ ලෝක සම්මත ධර්මයට ගරු කරමින් ම පරමාර්ථ දහමට තම අනුගාමිකයා පොළඹවා ඇති බවත් මේ කතා මාර්ගයෙන් සනාථ වේ. ඒ වන විට දේවවාදී හා අදේවවාදී ආගම් තුළින් ජනයා පෙළ ගස්වා තිබුණේ දිව්‍ය ලෝක සම්පත් හා බ්‍රහ්ම ලෝක සම්පත් අනුභවය සඳහා ය. ඔවුන්ගේ නිවන ද ඒවා ම වූහ.

එහෙයින් ම බුදුරජාණන් වහන්සේ ද තමන් වහන්සේගේ ධර්මය තුළින් දීමෙන් (දානයෙන්) හා සීලයෙන් (හික්මීමෙන්) මෙම දිව්‍ය ලෝක සම්පත් ලැබිය හැකි බවත්, භාවනාවෙන් ලෞකික වූ බ්‍රහ්ම සම්පත් ලැබිය හැකි බවත් දේශනා කරමින් ම කාම, රූප, අරූප භව සම්පත්තීන්හි ආදීනව දේශනා කළ සේක. ආදීනව දේශනාව මඟින් තම අනුගාමිකයා කාමයන්ගෙන් මුදවා ගැනීමට නෙක්ඛම්ම දේශනාව කළ සේක. කාම සම්පත්ති ආදීනව දැක හික්මුණු ශ්‍රාවකයාට කාය විවේකය, චිත්ත විවේකය හා උපධි විවේකය ලබා දෙන ත්‍රිවිධ

**බුදුරජාණන් වහන්සේ ලෝක සම්මත ධර්මයට ගරු කරමින් ම පරමාර්ථ දහමට තම අනුගාමිකයා පොළඹවා ඇති බවත් මේ කතා මාර්ගයෙන් සනාථ වේ. ඒ වන විට දේවවාදී හා අදේවවාදී ආගම් තුළින් ජනයා පෙළගස්වා තිබුණේ දිව්‍ය ලෝක සම්පත් හා බ්‍රහ්ම ලෝක සම්පත් අනුභවය සඳහා ය.**

විවේකය අනතුරුව උගන්වන සාමුක්කංසික (ගැඹුරු) දේශනාවට සිත මෙහෙයවන ලදී. මේ එක් එක් කතාවේ ආනිසංශ පෙළ දහමෙහි හා අටුවාවන් හි සඳහන් ය. ඒ පිළිවෙළ කථා නම් දාන කථා, සීල කථා, සග්ග කථා, ආදීනව කථා, නෙක්ඛම්ම කථා හා සාමුක්කංසික දේශනා ය.

දාන කථා නම් කුමක්ද? දානය නම් අල්ලා නොගෙන දීමයි. දිය යුතු කෙසේද? ලෞකික අපේක්ෂා රහිතව නිවන් අරමුණු කොට ගෙන ම දීම බෞද්ධයාගේ දානය යි. එනම් තණ්හාව ක්ෂය වන පරිදි දීමයි. දෑත්, දෙපා ආදී කොට බාහුව වෙහෙසා, දහඩිය හෙළා, ගත සිත යොදා, උපයා ගත් දෙයින් දෙන වස්තුව ම උතුම් දීම ලෙස සැලකේ. එසේ වුවත් ධර්ම දානය ම උතුම් වන අතර අභය දාන, ශ්‍රමදාන ආදී පරිභෝග නොවන වස්තු දීම ද පරිභෝග වස්තූන් දීමට වඩා උතුම් දාන ලෙස දහමෙහි සඳහන් වේ.

එසේම දන් දීමේ බොහෝ ප්‍රභේද ඇත. මෙහිදී බෞද්ධයන්ගේ දන් දීම ගැන සඳහන් කරන විට ශ්‍රද්ධාවෙහි පිහිටා දන් දීම වඩාත් ඵලදායක වේ.

පින කෙතක් වේ නම්, එය පෝරු ගා බීජ වැපිරීමට කෙත සකසා ගැනීම ශ්‍රද්ධාවයි. තුනුරුවන් විශ්වාස කොට තුනුරුවන් ගුණ විමසීමේ දී ඒ ගැන තව තවත් විශ්වාසය තහවුරු වේ නම්, තුනුරුවන් කෙරෙහි පැහැදේ නම් ශ්‍රද්ධාව එය ම වේ.

ශ්‍රද්ධාව පිහිටා තිබේ ද යන්න තේරුම් ගැනීමට මිණුම් දඬු තුනක් ධර්මයේ සඳහන්ව තිබේ. එනම් දීමට ඇති කැමැත්ත,



සත්පුරුෂ ඇසුරට ඇති කැමැත්ත හා සද්ධර්ම ශ්‍රවණයට ඇති කැමැත්ත වශයෙනි. ශ්‍රද්ධාවෙහි පිහිටා දන් දීමෙන් ලැබෙන අනුසස් මෙසේ ය. චාග නම් වූ අත්හැරීම මෙහි දියුණු අවස්ථාවයි.

දානය නම් සැප ලැබීමට නිදානයකි.

සම්පත් ලැබීමට මුලයි.

භෝග ලැබීමට ආධාරකයකි.

විරුද්ධ කරුවන් නැති කරවන්නකි.

ආරක්ෂාව සලසන්නකි.

පරලොව ගමනට පිහිටකි

මෙලොව, පරලොව දෙකට ම දානය සමාන අස්වැසිල්ලක්, පිහිටක් තවත් නැත.

අරමුණක් ඇති දෙයකි.

දානය ලෙනක් මෙනි. දානය සිත සිතා සිත නවතා ගත හැකි තැනෙකි. සිතට නැවතිය හැකි පහසු තැනකි. දන් දීම හොඳ පුරුද්දකි. අනාගත බලාපොරොත්තු තබා ගත හැකි දෙයකි.

අනුන් සිත් දිනාගත හැකි මෙවන් දෙයක් තවත් නැත.

දානය පිහිටක් කොට යන අර්ථයෙන් ගන්නේ නම්, 'රනින් කළ සිංහාසනයක්' හා සමාන ය.

අපිරිසුදු වූ මසුරු මල (ලෝභකම) ආදියෙන් ගත් කල දානය 'පියුමකි.'

අපිරිසුදු වූ මසුරු මල (ලෝභකම) දැවීම් අර්ථයෙන් ගත් කල 'ගින්නක්' වැනි ය.

සතුරකුට ළං නොවීම අර්ථයෙන් ගත් කල 'ආසිවිසයෙකි' එනම් සර්පයෙකි.

භය නැති අර්ථයෙන් ගත් කල දන් දෙන්නා 'සිංහයෙක්' වැනි ය.

දානය බල අර්ථයෙන් ගත් කල 'ඇතෙකි'.

මංගල සම්මත අර්ථයෙන් ගත් කල 'සුදු ගොනෙකි' ක්ෂේම භූමියට කැඳවාගෙන යන අර්ථයෙන් ගත් කල වළාහක (අහසෙහි ගමන් කළ හැකි) අශ්ව රාජයෙකි. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ,

"මහණෙනි,මේ දානය නම් තමන් වහන්සේ සසර ආ මාර්ගය' යි යනුවෙනි. 'මාගේම වංශය' වශයෙනි. දස පාරමිතා පූරණය කළ මේ මාගේ 'මහා යාගය'යි.

සසරේ දී වේලාම මහා යාගය (වේලාම සූත්‍රයේ එයි) මහා ගෝවින්ද මහා යාගය, (මහා ගෝවින්ද සූත්‍රය) මහා සුදස්සන මහා යාගය (මහා සුදස්සන සූත්‍රය) වෙස්සන්තර මහා යාගය (වෙස්සන්තර ජාතක කතාව) ආදී නොයෙක් මහා දාන යාගයෝ මවිසින් පවත්වන ලදහ. සා ජාතියෙහි සිටි කල දැල්වෙන ගිනි කඳෙහි පැන ජීවිතය දන් දීමෙන් යාචකයාගේ සිත් ගන්නා ලදී.

දානය වනාහි ශක්‍ර සම්පත්ති ලබා දෙයි.

බෝසත් සමයෙහි සත්තිස් වතාවක් පින්කොට සක් දෙවිඳුව උපන් බව තථාගතයන් වහන්සේ මා පුඤ්ඤභායි සූත්‍රයේ දී දේශනා කර ඇත.

දානය බ්‍රහ්ම, චක්‍රවර්ති සම්පත්තිය, ශ්‍රාවක පාරමී ඥාණය, පච්චේක බෝධි ඥාණය, අභිසම්බෝධි ඥාණය ආදී මේ ඥාණයන් ලබා දෙයි.

පෞද්ගලික දානයකට වඩා ආර්ය මහා සංඝරත්නයට පොදුවේ දෙන දානය උතුම් ය. ආර්ය මහා සංඝ රත්නය සිහිකොට දුශ්ශීලයකුට හෝ කාසාවකණ්ඨයකුට හෝ දෙන දානය ද උතුම් වූවක් ම ය.

නිවෙසේ ඇති දැඩි කරන සුනඛයාට දෙන ආහාරයට වඩා නිදැල්ලේ හැසිරෙන සුනඛයකුට දෙන ආහාරයෙහි පින් වැඩි ය. (ම.නි. දක්ඛිණා විභංග සූත්‍ර අටුවාව බලන්න.)

දන් දීමේ ආනිසංස ලෙස වැඩියෙන් දුන් තරමට පින් ද වැඩි ය.

බුදුරජාණන් වහන්සේ සැරියුත් හිමිට පිදූ දානය හා සැරියුත් හිමියෝ බුදුරජාණන් වහන්සේට පිදූ දානයේ වැඩි ආනිසංස වූයේ, බුදුරජාණන් වහන්සේට ය. ඒ, දන්දීමේ අනුසස් සැරියුත් හිමිට වඩා බුදුරජාණන් වහන්සේ දැන සිටිහෙයින් ය.

ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**

# සමගිව සංවිධානය විය යුතු අවස්ථාවක්

**දුටුගැමුණු මහ රජතුමා**

**72 කොටස**

**ප්‍රසුදින උදෑසන දීඝජන්තු මහ සෙනෙවි හමුවීමට ගිය සිරිනාග තම සිත තුළ පවතින බියත් සැකයත් ප්‍රකාශ කළේ ය.**

"සෙනෙවිතුමනි, අනුරාධපුර චරපුරුෂ සේවය අහෝසි කළ බව තුණ්ඩිල පැවසුවත්, අපේ සංවිධාන තොරතුරු මාගමට ආරංචි වෙන්නේ නැති බවට අපට සහතික වෙන්නට පුළුවන් ද ? මා දිගාමඩුල්ලට යාමට කසාතොටින් එතෙර වූ බවට ආරංචිය ගියේ විජිතපුරයෙන් නම් අපි වඩාත් ප්‍රවේසම් විය යුතුයි නේද ?"

ඔව් , නමුත් දැන් ඒ සියලු අවස්ථා අවුරලා. කිසිම පණිවුඩයක් ගත් පරෙවියෙක්, හී පතක් අපේ සෙබළුන්ට නොදැනී මහවැලි ගඟින් එතෙරට යන්නේ නැහැ.

"කෙසේ වුවත් අපේ යුධ මෙහෙයුම් කාර්යයෙහි සාර්ථකත්වය සඳහා යුද්ධ රහස් පිටතට යන්නට නොදී රැක ගැනීමට අවශ්‍යයි"

"සිරිනාගට අද විශේෂ උපහාරයක් කෙරෙනවා. තුණ්ඩිලට පනවා ඇති තහනම ඉවත් කරන්නට සිරිනාග මැදිහත් වෙන්නට ඕනෑ . උපතිස්ස වෙළඳ නියෝජිතයකු කර ප්‍රාදේශීය රාජ්‍යවලට යැවීමේ වැදගත්කම මෙහිදී පෙන්වා දෙන්නට ඕනෑ . "

"වෙලාව හරි; අපි දැන් යමු. විවාදවලින් තොරව එක තීරණයකට එන්නට බලමු. "

"ඔවුන් රාජ සභාවට පැමිණියේ අස්රියකිනි. එහිදී ද දීඝජන්තු උත්සාහ කළේ තමන්ගේ යෝජනා සිරිනාග ලවා අනුමත කරවා ගැනීමට ය. තුණ්ඩිලට විජිතපුර බලකොටුවේ බලතල යම් ප්‍රමාණයක් ලබාදීම ඔහුගේ අරමුණ බව සිරිනාගට අවබෝධ විය.

ඔවුන් පැමිණෙන විට රාජ සභාව රැස් වී හමාර ය. සියල්ලෝම අසුන් ගෙන සිටියහ. තම ප්‍රමාදය පිළිබඳ සමාව අයැදිමින් රජුට ආචාර කළ සිරිනාගත්, දිඝජන්තුත් අසුන් ගත්හ.

රාජ සභාවේ කථාව ආරම්භ කළේ රජතුමා ය.

"ඇමතිවරුනි , රාජ්‍ය නිලධාරිනි, යුද්ධ මණ්ඩල සාකච්ඡා අඩු කොට සියලු දෙනාම යුද්ධ කාර්යයට යොමු කිරීම මගේ තීරණයයි. රාජ්‍ය පරිපාලන කටයුතු සියල්ල ඇමති මණ්ඩලයට පවරනවා. යුද්ධයට ඒ ඒ අවස්ථාවන්ට ගැලපෙන ලෙසට කටයුතු කිරීමේ බලය කුඩා මණ්ඩලයකට පවරනවා "

"අද රාජ්‍ය සභාව රැස්වීමේ ප්‍රධාන අරමුණ සිරිනාග මහා සෙනෙවි තුමාට රාජ්‍ය සභාවේ සහ සමස්ත සේනාංකවල ම උපහාරය පිරිනැමිය යුතු බව යෝජනා කිරීමයි "

"සිරිනාග අපෙන් දස දහසක සේනාංකයක් රැගෙන ගොස්, දුටුගැමුණු රජු සමග කළ යුද්ධයේ දී තිස්ස කුමාරයාට ජය ලබා දුන්නා. දෙවෙනි වර සටනේ දී අපි තවත් දස දහසක් දීඝාභය මහා සෙනෙවිගේ ඉල්ලීම මත දිගාමඩුල්ලට යැව්වා. එවර සේනාව මෙහෙයවීම සඳහා උපතිස්ස සෙනෙවි යැවීමට යෝජනා වී තිබුණත් සිරිනාග ම යැවීමට අපි ඔහු කැමැති කරවා ගත්තා."

"ඔහු වෙස්වළාගෙන කසාතොටින් එගොඩ වූයේ කිසදු සැකයකින් තොරවයි. නමුත් අපෙන්ම ගිය ඔත්තුවක් නිසා ඔහු සතුරන් අතට පත්වුණා. ඔහු මරණ දණ්ඩනයට නියම වුණා. නමුත් මෙහි සිරභාරයේ සිටි සියලුම චරපුරුෂයන් වන්දියට දී අපි සිරිනාග නිදහස් කර ගත්තා."

"සිරිනාග අපට කිහිප ආකාරයකින්ම වැදගත්.දැනට මාගමින් අපට කිසිම තොරතුරක් ලැබෙන්නේ නැහැ. ඒ අතිනුත් අපට උපකාරයට ඉන්නේ සිරිනාග පමණයි"

"රජතුමනි, චරපුරුෂයන් නිදහස් කර යැවීමේ දී අපේ චරපුරුෂයන් දෙතුන් දෙනෙකුත් ඒ අතරට එකතු කළා නම් අපට වාසියක් අත්පත් කර ගන්නට තිබුණා "

"එබඳු උපදෙසක් දෙන්නට තරම්වත් බුද්ධිමතුන් අප අතර නෑ සිරිනාග" රජතුමා කනස්සල්ලෙන් යුතුව පැවසීය.

රාජ සභාවේ කා තුළත් ඇතිවූයේ ලජ්ජාවකි.

'මහ රජතුමනි, අපි කවුරුත් සමගිව සංවිධානය විය යුතු අවස්ථාවක් මේක. දුටුගැමුණු බලසේනාව, විහාර මහා දේවිය පෙරටු කරගෙන දැන් මැදගම් උයන්තොට පැමිණිලා. තවත් දින කිහිපයකින් යුද හරඹ සංදර්ශනයක් පවත්වනවාලු.'

රජතුමාගේ මුහුණ කළු වී අඳුරු වනු කාටත් දැකගත හැකි විය. රාජ සභාවේ කාගේත් මුහුණුවල තිබුණේ අඳුරු ස්වභාවයකි.

'දීඝජන්තු මහ සෙනෙවිතුමාගේ යුද මෙහෙයුම කෙරේ විශ්වාසය තැබිය හැකියි. උපතිස්ස සෙනෙවිගේ විජිතපුර බලකොටුවේ ආරක්ෂා සංවිධාන දීඝාභය මහ සෙනෙවිතුමාගේ උපදෙස් අනුව හොඳින් පවතිනවා. මහවැලි ගං තෙර කඳවුරු බලකොටු අප භාවිත කළ යුත්තේ උපායශීලීවයි. ඒ බව තේරුම්ගෙන ඒ සඳහා සුදුසු සෙනෙවියකු පත් කිරීම කළ යුතුයි."

'සිරිනාග, තොප කියන්නේ දැනට තිබෙන සැලසුම් එලෙසම ක්‍රියාත්මක කළයුතු බවද?'

'සුළු සුළු වෙනස්කම් කිහිපයක් කළ යුතු බවයි මගේ අදහස මහරජතුමනි. මහවැලි තොටමුණු සියල්ල දීඝාභය මහ සෙනෙවිතුමාට පවරමු. විජිතපුර බලකොටුව උපතිස්ස සෙනෙවිට පවරමු. අභ්‍යන්තර කටයුතු තුණ්ඩිල සෙනෙවිට භාරදීම සුදුසු යැයි මා සිතනවා. එවිට මොන විදිහේ සතුරු පහරකට වුවත් අපට මුහුණ දීමට හැකි වේවි. මේ සියල්ලේ වගකීම උපදේශක මණ්ඩලයක් සමඟ දීඝජන්තු මහ සෙනෙවිතුමාට පැවරිය හැකියි.'

'සිරිනාග මහ සෙනෙවිතුමාගේ සැලැස්ම මම අනුමත කරනවා. නමුත් උපතිස්ස සෙනෙවිගෙන් ලබා ගැනීමට අදහස් කරන විශේෂ රාජකාරියක් ගැනත් මේ මොහොතේ කතා කළ යුතු යි. සෝමනුවර, සේරුවිල, කැලණිය වැනි ප්‍රාදේශීය රාජ්‍ය දුටුගැමුණු රජතුමාට සහාය දීමෙන් වළක්වා ගත යුතු යි. ඒ සඳහා සාර්ථක දූත මෙහෙවරක් අපට අවශ්‍ය වී තිබෙනවා. එයට උපතිස්ස යොදා ගැනීමයි හොඳ. විජිතපුර බලකොටුව තුණ්ඩිල සෙනෙවිට භාර දෙනවා. අභ්‍යන්තර ආරක්ෂාව සිරිනාග මහ සෙනෙවිට පවරනවා.'

'මම තවත් සේනාංකයක් සොළී රටින් ඉල්ලා තිබෙනවා. මගේ බෑනා කෙනෙකු වන හල්ලුක දොළොස් දහසක සේනාවක් සමඟ මෙහි එන්නට සූදානම්. හල්ලුක ආවොත් අප යටත් කර ගන්නට එන දුටුගැමුණු සේනාංක පාඩම් ඉගෙන ගනීවි.

'මහ රජතුමනි, හොඳින් සංවිධානය වෙනවා නම් අපට දැනට තිබෙන සම්පත් හොඳටම ප්‍රමාණවත්. ආහාර ගබඩා පාලනයත්, ආයුධ ගබඩා පාලනයත් තවම තිබෙන්නේ දුර්වල තත්ත්වයක. අපට මේ අවස්ථාවේ දී කුණ්ඩල බ්‍රාහ්මණ තුමාත්, ජයනාථ මහ සිටුතුමාත් සම්බන්ධ කර ගත හැකි නම් ඉතා වැදගත්.'

'ඒ කාරණය අපි දීඝාභයට පවරමු. සිරිනාග නිසා ජයනාථ මහ සිටුතුමා අපට හිතවත්. ආහාර ගබඩා පාලනය ඔහුට පැවරීම හොඳයි. කුණ්ඩල බ්‍රාහ්මණතුමාගේ සහයෝගය ලබා ගන්නට බැරිනම් ආයුධ ගබඩා පාලනයට සිරිනාග හොඳයි.'

එය ඇසූ සිරිනාග සිත යටින් සතුටට පත්ව නිශ්ශබ්දව සිටියේ ය.

දේවයන් වහන්ස, මගේ අදහස මහවැලි ගඟ දකුණු ඉවුරේ බලකොටු තව දුරටත් ශක්තිමත්ව තබා ගැනීම අවශ්‍ය බවයි. යම් හෙයකින් ගැමුණු හමුදා දහස් තොටින් එතෙරව විජිතපුර, මහෙල, බලකොටු මඟහැර රාජ්‍ය නගරයට පහරදීමට ආවොත්, අපට ඔවුන් අවුලට පත් කළ හැක්කේ මාගම ගම්බිම්වලට පහර දීමෙන්. මාගම රාජධානිය පහසුවෙන් ම අල්ලා ගන්නට පුළුවන්.'

ඒ අදහස ඇසූ එළාර රජුගේ මුහුණට සිනහවක් නැගිණි. දීඝාභය දීඝජන්තු දෙදෙනා කුතුහලයට පත් බවක් පෙනෙන්නට තිබිණි. සිරිනාගගේ ඒ අදහස අනුමත කළ රජතුමා එම බලකොටු තව තවත් ශක්තිමත් කරන්නට අණ කළේ ය.

මේ සියලුම කරුණු පිළිබඳ සැලකිල්ලට යොමු කළ රජතුමා යුද්ධ සංවිධාන සැලැස්ම ඉදිරිපත් කිරීමට දීඝජන්තු මහ සෙනෙවිට අණ කළේ ය. තවද යුද්ධ මණ්ඩල රැස්වීම තුන් දිනක් ඇතුළත කැඳවන ලෙස නියම කළේ ය. සියලු දෙනාගේ අනුමැතියෙන් තුණ්ඩිලට පනවා තිබුණු යුද්ධ සම්මන්ත්‍රණවලට සහ රාජ සභාවට පැමිණීමේ තහනම් නියෝගය ද අවලංගු කෙරිණි.

අයන්ති විතාන

